# දඹදෙණි යුගයේ භික්ෂු සමාජයේ පැවති කුලභේදය: දඹදෙණි කතිකාවත ඇසුරෙන් අධ්‍යයනයක්

## The caste system among the monks in Dambadeni period: A study based on Dambadeni Kathikāvatha

හොරගල විමලතිස්ස හිමි


## Abstract

The period of Dambadeni Kingdoms which started in the 13th century was a period that was plagued by political enemy invasions. At this time, there was also a serious decline in the community of monks. As a result, 'Dambadeni Kathikāvata' was compiled. Although there is information about the Dambadeni Kathikāvatha and the decline of the monk society, the caste system in the monk society at this time has not been widely discussed. This research aims to fill that research gap. Through the literary sources written in the Dambadeni period, information about the caste system of the monk society is also found. But this article focuses only on the Dambadeni Kathikāvatha. The research problem here is how the caste system started in the monks' society in the Dambadeni period. Here the Dambadeni Kathikāvatha was used as the primary source and the secondary source was also consulted. Data was collected through library research according to qualitative research methodology. The caste system of the monastic community, which continues to this day, begins in the Dambadeni period. Therefore, this research is important to identify how caste was established in the monk society at that time, and to understand how caste in the monk society has evolved since then. Although

there is no information about a caste among the monks in the Polonnaru Kathikāvatha, information is found about a caste called 'Vessa' that existed during the reign of King Devanampiyatissa as mentioned in the Mahavamsa. It could be finally concluded that the South Indian social corporation established in this country was inspired by the Chola invasions of South India, the Kalinga Māgha invasion and the caste criticism of the monk society at this time in terms of kinship.

**Keywords:** Caste, Dambadeni Kathikāvatha, Dambadeni period, Priesthood, Society of monks, Shasanika Kathikāvath

**සාරසංක්ෂේපය**

ක්‍රි.ව. 13 වන සියවසේ දී ආරම්භ වූ දඹදෙණි රාජධානි සමය දේශපාලනික සහ සතුරු ආක්‍රමණවලින් ගහන ව පැවැති කාලවකවානුවකිග මෙකල භික්ෂු සමාජයෙහි ද බරපතළ පිරිහීමත් දක්නට ලැබුණි. එහි ප්‍රතිඵලයක් ලෙසින් ‘දඹදෙණි කතිකාවත’ සම්පාදනය විණි. දඹදෙණි කතිකාවත පිළිබඳ ව සහ භික්ෂු සමාජයෙහි පරිහානිය පිළිබඳ ව තොරතුරු පැවතිය ද, මෙකල භික්ෂු සමාජයෙහි පැවැති කුලභේදය සම්බන්ධ ව පුළුල් ව කතාබහට ලක් වී නොමැත. එම පර්යේෂණ හිඩැස පිරවීම මෙහි පර්යේෂණ අරමුණ යි. දඹදෙණි යුගයේ රචිත සාහිත්‍ය මූලාශ්‍රය ඔස්සේ ද භික්ෂු සමාජයෙහි කුලභේදය පිළිබඳ තොරතුරු හමුවේ. නමුත් මෙම ලිපියේ දී අවධානය යොමු කරන්නේ දඹදෙණි කතිකාවතට පමණි. දඹදෙණි යුගයේ භික්ෂු සමාජයෙහි පැවති කුලභේදය ආරම්භ වූයේ කෙසේ ද යන්න මෙහි පර්යේෂණ ගැටලුව යිග මෙහි දී දඹදෙණි කතිකාවත ප්‍රාථමික මූලාශ්‍රය ලෙස භාවිත කළ අතර ද්විතීයික මූලාශ්‍රය ද පරිශීලනය කෙරිණි. ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදයට අනුව පුස්තකාල විමර්ශනය ඔස්සේ දත්ත රැස් කෙරිණ. වර්තමානය තෙක් අඛණ්ඩ ව පවතින භික්ෂු සමාජයෙහි කුලභේදය ආරම්භ වන්නේ දඹදෙණි යුගයෙනි. එබැවින් එකල කුලභේදය භික්ෂු සමාජයෙහි ස්ථාපිත වූ ආකාරය

හඳුනාගැනීමටත්, එතැන් පටන් වර්තමානය දක්වා භික්ෂු සමාජයෙහි කුලභේදය විකාශනය වූ අයුරු වටහා ගැනීමටත් මෙම පර්යේෂණය වැදගත් වේ. පොළොන්නරු කතිකාවතෙහි භික්ෂූන් අතර කුලභේදයක් පිළිබඳ ව තොරතුරු හමු නොවුණ ද, මහාවංශයෙහි සඳහන් අන්දමට දේවානම්පියතිස්ස රාජ්‍ය සමයේ පැවති 'වෙස්ස' නමැති කුලයක් පිළිබඳ ව තොරතුරු හමුවේ. දකුණු ඉන්දීය චෝල ආක්‍රමණ නිසා මෙරට ස්ථාපිත වූ දකුණු ඉන්දීය සමාජ සංස්ථාවෙහි ආභාසය ලැබීම, කාලිංග මාඝ ආක්‍රමණය සහ ඥාති සංග්‍රහ වශයෙන් මෙකල භික්ෂු සමාජයෙහි කුලගෝත්‍ර විචාරීම සිදු වී ඇති බව අවසන් වශයෙන් නිගමනය කළ හැකි විය.

**ප්‍රමුඛ පදඃ** කුලභේදය, දඹදෙණි යුගය, දඹදෙණි කතිකාවත, පැවිද්ද, භික්ෂු සමාජය, ශාසනික කතිකාවත්

**හැඳින්වීම**

පොළොන්නරු රාජධානියේ බිඳවැටීමත් සමඟ රාජධානිය දඹදෙණියට සංක්‍රමණය වන්නට විය. ඒ ක්‍රි.ව. 13 වන සියවසේ දී ය. පොළොන්නරු රාජධානිය බිඳ වැටීමත්, එයට පාදක වූ කාලිංග මාඝ ආක්‍රමණයත් ලාංකේය භික්ෂු සමාජය වෙත දුර්භාග්‍ය පරිසරයක් නිර්මාණය කිරීමට හේතු විය. කාලිංග-පාණ්ඩු දෙපිලේ අර්බුදය දඹදෙණි රාජධානියේ ආරම්භය තෙක් පැවතුණි. මෙකල භික්ෂූන් වහන්සේලා විදෙස් රටවලට වැඩම කළ අතර ඇතැම් භික්ෂූහු අප්‍රකට ජීවිත ගත කළහ. මෙම ලිපියේ දී ප්‍රමුඛ අවධානය යොමු වන්නේ දඹදෙණි යුගයේ භික්ෂු සමාජය වෙත යි. එකල භික්ෂු සමාජයෙහි බරපතළ පරිහානිකර ස්වභාවයක් දක්නට ලැබුණි. බොහෝ භික්ෂූහු සසුන් මඟ මුළුමනින් ම අමතක කර සිටියහ. වැඩිහිටි හා තරුණ භික්ෂූන් අතර සමීප සම්බන්ධයක් නොතිබුණු අතර තරුණ භික්ෂූහු වැඩිහිටි භික්ෂූන්ට ගරු නොකළහ. ගිහි මඟ සහ සසුන් මඟ අතර පැහැදිලි වෙනසක් දක්නට නොලැබිණි. මෙයට පිළියමක් වශයෙන් සංඝ සම්මුතියකින් ව්‍යවස්ථා පන්තියක් ඇති කර ගන්නට විය. එය

'දඹදෙණි කතිකාවත' නම් වේ. මෙම කතිකාවත පොළොන්නරු කතිකාවත වැඩිදියුණු කරමින් සකස් කර ගන්නා ලද්දකි.

'කතිකා' යන්නෙන් 'කටයුතු යැයි සම්මත කරගත් ව්‍යවස්ථා' යන අර්ථය කුළුගැන්වේ. සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය සඳහා ශාසනය පිරිහී ගිය සමයන්හි ධර්ම විනය සසඳා ප්‍රමාද විහාරීන්ට අවකාශ නොලැබෙන පරිද්දෙන් මහා සංඝයා වහන්සේ විසින් කාලානුරූප ව පනවන ලබන සංඝ සම්මත ව්‍යවස්ථා 'කතිකාවත්' යන නාමයෙන් හඳුන්වනු ලැබේ (සිංහල විශ්වකෝෂය,1978:112). ලක්දිව බුදු සමයේ කතිකාවත් විහාර කතිකාවත් සහ ශාසන කතිකාවත් යනුවෙන් දෙකොටසකින් සමන්විත ය. දඹදෙණි කතිකාවත ශාසනික කතිකාවතකි. භික්ෂූන්ගේ විනය සම්බන්ධ පැනවීම් 'ශාසනික කතිකාවත්' ලෙස හඳුන්වයි. දඹදෙණි කතිකාවත කොටස් දෙකකින් යුක්ත ය. මුද්‍රිත පේළි 92ක් පමණ වන පළමු කොටස ඓතිහාසික සංඥාපනය යි. මුද්‍රිත පිටු දොළහක් පමණ පුරා ව්‍යවස්ථා සියයක් පමණ අන්තර්ගත දෙවන කොටසින් භික්ෂූන් උදෙසා පැනවූ ව්‍යවස්ථා මාලාව දැක්වේ. කතිකාවත සම්පාදනයේ දී වනරතනාභිධාන බුද්ධවංශ මහා ස්ථවිර පාදයන් වහන්සේගේ ප්‍රධාන ශිෂ්‍ය තත්කාල ශාසනානුශාසක අරණ්‍යක මේධංකර මහා ස්වාමි ප්‍රමුඛ ග්‍රාමරණ්‍යවාසී කාරක මහා සංඝයා වහන්සේ මුල් වූ බව දඹදෙණි කතිකාවතෙහි සඳහන් වේ (ජයතිලක, 2002:10). "එක් එක් යුගයන්හි දී භික්ෂු සමාජයේ විකාශනය පිළිබඳ ව කතිකාවත් තරම් තොරතුරු හෙළි කරන වෙනත් මාධ්‍යයක් නොමැති තරම් ය" (සිරිසුමන, 2006: 01).

## සාහිත්‍ය විමර්ශනය

මෙම ලිපියෙහි සාහිත්‍ය විමර්ශනයේ දී අවධානය යොමු කරන්නේ දඹදෙණි යුගයේ භික්ෂු සමාජයේ පැවති කුලභේදය සම්බන්ධයෙන් සිදු වී ඇති පර්යේෂණ ආශ්‍රිත සාහිත්‍යය පිළිබඳ ව ය. මෙහි දී විවිධ පොත්පත් විමර්ශනය කිරීමට සිදු විය. ඒ. වී. සුරවීරගේ සිංහල කතිකාවත් සහ භික්ෂු සමාජය (2002) සහ

කතිකාවත් විමර්ශන (1998) කෘති මෙම පර්යේෂණයේ දී බෙහෙවින් වැදගත් විය. පොළොන්නරු කතිකාවතෙහි සිට වර්තමානයේ පවතින ශාසනික කතිකාවත් දක්වා අවබෝධයක් ලබා ගැනීමට මෙම කෘති ද්වය උපකාරී විය. ආනන්ද කුලසූරියගේ සිංහල සාහිත්‍ය 2 (1963) කෘතියේ දී දඹදෙණි යුගයේ භික්ෂු සමාජයෙහි කුලභේදය පැවතීමට හේතු වූ කාරණා පිළිබඳ ව අවධානය යොමු කර තිබේ. අමරදාස ලියනගේ රචිත ඉතිහාසයෙන් පෙනෙන භික්ෂුව හා සමාජය (1966) කෘතිය දඹදෙණි යුගයේ භික්ෂු සමාජය හඳුනා ගැනීමට බෙහෙවින් ඉවහල් විය. අගලකඩ සිරිසුමන හිමිගේ දඹදෙණි කතිකාවත සහ භික්ෂු සමාජය (2006) කෘතිය දඹදෙණි කතිකාවත පිළිබඳ ව සහ තත්කාලීන භික්ෂු සමාජය පිළිබඳ ව තොරතුරු සපයා ගත හැකි වටිනා මූලාශ්‍රයකි. තිඹිරිවැව සිරිසුමන හිමි සංස්කරණය කළ දඹදෙණි යුගයඃ දේශපාලන සහ සංස්කෘතික සමීක්ෂා (2019) කෘතියේ අන්තර්ගත තිඹිරිවැව සිරිසුමන හිමි සහ නාලක ජයසේන විසින් රචිත "භික්ෂු සමාජය හා සංඝ සංශෝධන" නමැති ලිපිය මෙම පර්යේෂණයට ඉවහල් වූ වැදගත් මූලාශ්‍රයකි. දැනට පවත්නා පර්යේෂණ සාහිත්‍යය උක්ත තේමාවට අදාළ තොරතුරු කවරාකාරයකින් සංශෝධනය සංගෘහිත වන්නේ දැයි විමසා බැලීම මෙම සාහිත්‍ය විමර්ශනයෙහි අරමුණ වේ. මේ අනුව දඹදෙණිය යුගයේ භික්ෂු සමාජයෙහි පැවැති කුලභේදය පිළිබඳ ව අධ්‍යයනය කිරීම මගින් පර්යේෂණ සාහිත්‍යයට සිදු වනුයේ සුවිශේෂ දායකත්වයකිග මින් මතුවට මේ පිළිබඳ උනන්දු දක්වන්නන් උදෙසා මෙම ලිපිය පර්යේෂණ සාහිත්‍යමය වශයෙන් දායකත්වයක් ද සපයනු ලබයි.

**පර්යේෂණ ගැටලුව**

- දඹදෙණි යුගයේ භික්ෂු සමාජයෙහි පැවැති කුලභේදය ආරම්භ වීමට බලපෑ හේතු මොනවාද?

**උප ගැටලුව**

- මුල් බුදු දහමෙහි හෝ පොළොන්නරු කතිකාවතෙහි නො තිබුණු කුලගෝත්‍ර විචාරීමක් දඹදෙණි කතිකාවතට ඇතුළත් වූයේ කෙසේ ද?

**පර්යේෂණ අරමුණ**

- දඹදෙණි යුගයේ භික්ෂු සමාජයෙහි කුලභේදය පිළිබඳ ව අධ්‍යයනය කිරීම

**පර්යේෂණ ක්‍රමවේදය**

දඹදෙණි යුගයේ භික්ෂු සමාජයෙහි පැවති කුලභේදය පිළිබඳ ව අධ්‍යයනය කරන මෙහි පර්යේෂණ ක්‍රමවේදය ලෙස ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය භාවිත කර ඇත. එහි දී දත්ත රැස් කිරීමේ දී ලේඛන විමර්ශනය හා පුස්තකාල අධ්‍යයන විධික්‍රම භාවිත කර ඇත. ද්විතීයික මූලාශ්‍රය එක්රැස් කරගැනීමේ දී පුස්තකාල අධ්‍යයන විධික්‍රමය ඔස්සේ පහත සඳහන් ස්ථාන දායක කරගනු ලැබිණි.

- කොළඹ විශ්වවිද්‍යාලයේ ප්‍රධාන පුස්තකාලය
- සිංහල අධ්‍යයනාංශයේ පුස්තකාලය

**පර්යේෂණයේ වැදගත්කම**

- දඹදෙණි යුගයේ භික්ෂු සමාජය පිළිබඳ ව වටහා ගැනීමට හැකිවීම
- තත්කාලීන භික්ෂු සමාජයෙහි පැවති කුලභේදය හඳුනාගැනීමට හැකිවීම
- දඹදෙණි කතිකාවතින් නිරූපිත භික්ෂුව පිළිබඳ ව අධ්‍යයන සිදුකර තිබුණ ද, එකල භික්ෂූන් අතර පැවැති කුලභේදය පිළිබඳ ව වෙන ම පර්යේෂණයක් සිදු කර නො තිබීම
- කුල සාධකය පදනම් කරගනිමින් විවිධ නිකායන්ට බෙදී සිටින භික්ෂු සමාජයේ විකාශනය හා එහි මූලාරම්භය ගවේෂණය කිරීමට හැකිවීම

**සාකච්ඡාව**

කුලය යනු ආරෝපිත තත්වය ඇති සමූහයක් තුළින් ඉස්මතු වන ධූරාවලියක් සහිත වූ සමාජ සංවිධානයකි (Rayan,1953). සමාජ ස්තරායනයට අනුව සමාජයේ පවතින හළ යුතු සාධකයක් ලෙසින් කුල සාධකය හඳුන්වා දිය හැකි ය. අනාදිමත් කාලයක සිට මෙම කුල සාධකය සමාජයෙහි පැවතුණි. බුද්ධකාලීන භාරතීය සමාජයෙහි බ්‍රාහ්මණ, ක්ෂත්‍රීය, වෛශ්‍ය හා ශුද්‍ර යනුවෙන් චතුර් වර්ණයක් තිබූ අතර ඊට අමතර ව පංචම කුලයක් ද දක්නට ලැබුණි. දඹදෙණි කතිකාවත විමර්ශනය කිරීමේ දී හමුවන සුවිශේෂ කරුණක් වනුයේ පැවිදි කිරීම සහ සංඝ පදවි තානාන්තර ලබා දීමේ දී ජාති කුල ගෝත්‍ර විමසා බැලීම යි. කුල සාධකය පළමුවෙන් ම අන්තර්ගත ශාසනික කතිකාවත බවට පත් වන්නේ ද දඹදෙණි කතිකාවත යි. ඒ කවර හෙයින් ද යත් පොළොන්නරු කතිකාවතෙහි එවැන්නක් පිළිබඳ ව සඳහනක් හමු නොවන බැවිනි. නමුත් අනුරාධපුර යුගයේ භික්ෂු සමාජයේ කුලභේදයක් පැවැති බව මහාවංශයෙන් හෙළි වේ. දේවානම්පියතිස්ස රජතුමා විසින් පිහිටුවන ලද ආරාමයන් 'වෙස්ස' යනුවෙන් මහාවංශයේ දැක්වේ. ශාසනයට ඇතළුවීමට පෙර වෙස්ස (වෛශ්‍ය) කුලයට අයත් පන්සියයක් එම ආශ්‍රමය පිහිටි ගමෙහි වාසය කළහ. මේ පිරිස මහණ වීමෙන් පසු ව එහි ජීවත් ව සිටි නිසා එය වෙස්සගිරි වූ බව මහාවංශයේ සඳහන් වේ. අනෙක් ආශ්‍රමයන්ගෙන් වෙන් ව මෙය පිහිටා තිබී ඇත. ඉස්සර (රදල) හා වෙස්ස කුලවලින් පැමිණ මහණ වූ අය එක ම ගම් ප්‍රදේශයක ආශ්‍රම දෙකක ජීවත් වූ බව පෙනෙයි. ඉසුරුමත් කුලවලින් පැමිණ පැවිදි වූවන් වාසය කළ ස්ථානය 'ඉසුරුමුණි' නම් විය (2015:82). සංඝ සමාජයට ඇතුළත් වීමට පෙර ඔවුන්ගේ තිබූ සමාජ තත්වය අනුව මෙය සිදු වන්නට ඇත. චේතියගිරි, අරිට්ඨ, පබ්බත යන ස්ථානවල ද ක්ෂත්‍රීය වංශික භික්ෂූන් විසූ බව මහාවංශයේ දැක්වේ. සමාජයේ විවිධ පංතිවල බොහෝ ගණනින් පැවිදි බිමට ඇතුළත් වීමෙන් ඔවුන් සඳහා වෙන් වෙන් වශයෙන් ආශ්‍රම බිහි වූ අතර මහා විහාරයට අමතර ව අරිට්ඨ, පබ්බත, ඉස්සර සමනක, චේතියගිරි, වෙස්සගිරිය වැනි ආශ්‍රම ඇති වේ.

පසු කලෙක කුල ක්‍රමය අනුව සංඝයා භින්න වී යාමට මූල බීජ ඇති වන්නට ඇත්තේ මේ නිසා යැයි සිතිය හැකි ය. වල්පොළ රාහුල හිමියන් ද මුල් අවධියේ සිට ම ලංකාවේ සංඝයා කුල හා පන්ති වශයෙන් බෙදී සිටි බවක් මෙයින් හැඟේ ද යනුවෙන් ප්‍රශ්න කරයි (1999:62).

"න ජච්චා වසලො හොති - න ජච්චා හොති බ්‍රාහ්මණො,

කම්මනා වසලො හොති - කම්මනා හොති බ්‍රාහ්මණො"
(ඛු.නි. වසලසුත්ත,2006:42-43).

බ්‍රාහ්මණ වර්ණ ක්‍රමය ප්‍රතික්ෂේප කළ බුදුදහම පුද්ගලයෙකු උපතින් බ්‍රාහ්මණයෙකු හෝ වසලයෙකු හෝ නො වන බවත්, ක්‍රියාව අන්ව උත්තම හෝ අධම වන බවත් උගන්වයි. මේ අනුව ප්‍රකට වන්නේ බුදු දහම කුලභේදය සපුරා ම ප්‍රතික්ෂේප කළ බව යි. කුල හීන පවුල්වල අය පැවිදි කරගැනීමෙන් සහ සමානාත්මතාවයෙන් සැලකීමෙන් එම අදහස වඩාත් තහවුරු වේ. ශ්‍රී ලාංකේය සමාජය ඉන්දීය බලපෑම්වලට හසු වූ නමුත් බුදු සමයේ බලපෑමත් සමඟ ඊට ආවේණික මාර්ගයක ගමන් කළ බව පැහැදිලි වේ.

පහාරාදය, යම් පරිදි යම් කිසි මහානදීහු වෙද්ද, එනම්ඃ ගංගා ය, යමුනා ය, අචිරවතී ය, සරභූ ය, මහී ය යන මොහු යි. ඔහු මහමුහුදට පැමිණ පළමු නම් ගොත් හරියි ද, මහමුහුද කියා ම සංඛ්‍යාවට යෙත් ද, පහාරාදය, එපරිදි ම ක්ෂත්‍රියයහ, බ්‍රාහ්මණයහ, වෛශ්‍යයහ, ශූද්‍රයහයි මේ චතුර්වර්ණයෝ වෙත් නම් ඔහු තථාගත ප්‍රවිදිත ධර්මවිනයෙහි ගිහිගෙන් නික්ම අනගාරියබවට පැමිණ පළමු නම් ගොත් හැරලත්. ශ්‍රමණශක්‍යපුත්‍රීයහ යන සංඛයාවට ම යෙත් (අං.නි. 5 පහාරාද සුත්ත, 2006:88-89).

නොයෙක් කුලවලින් පැමිණයේ වුව ද බුද්ධ ශාසනයෙහි පැවිදිභාවය ලබාගත් පසු ඔවුන් සියලුදෙනා ම 'ශ්‍රමණශාක්‍යපුත්‍ර' නමින් හඳුන්වන බව බුදුන් වහන්සේ දේශනා කළ බව යථෝක්ත පාඨයෙන් හෙළි වේ. "...යටත්පිරිසෙයින් තෙර තුන්නමක් ඇතුළුවූ සෙසු උපයුක්ත සංඝයා මධ්‍යයෙහි ජාතිගෝත්‍ර විචාරා විධානයෙහි

සිටියවුන් දැක්වූ කල උන් විසින් සියල්ල විචාරා රෝග බලා ලීම් කියවීම් බලා නායක තැන් දක්වා සියල්ල සැලකොට කුලදෝෂයක් ක්‍රියාදෝෂයක් නැතැයි දන්නා සඟ කෙනකුන් ප්‍රතිඥාකළ කල...” (ජයතිලක,2002:11).

දඹදෙණි කතිකාවතෙහි භික්ෂූන්ගේ කුලභේදය පිළිබඳ ව මුලින් ම සඳහන් වන්නේ පැවිද්ද සම්බන්ධයෙනි. දඹදෙණි යුගය වන විට භික්ෂු සමාජයෙහි පැවති පරිහානියත් සමඟ ශාසන ශුද්ධියක අවශ්‍යතාව පැන නැගුණි. එවක සසුන් මඟෙහි සහ ගිහි මඟෙහි වෙනසක් දක්නට නො ලැබුණු හෙයින් පැවිද්ද ලබා දීමේ දී ඔහුගේ පවුල් පරිසරය පිළිබඳ ව අවධානය යොමු කළා විය හැකි ය. අමරදාස ලියනගමගේ දක්වන අදහස වන්නේ ප්‍රව්‍රජ්ජාපේක්ෂකයාගේ තරාතිරම, ගෘහස්ථ ජීවිතය පිළිබඳ ව සොයා බැලීම කුල ගෝත්‍ර විචාරීමක් ලෙස කතිකාවතට ඇතුළත් වන්නට ඇති බව යි.

‘කුල දෝෂයක්, ක්‍රියා දෝෂයක් නැතැයි දන්නා සඟ කෙනෙකුන් ප්‍රතිඥා කළ පසු පැවිදි කළ යුතු ය’ යන සම්මතය ලක්දිව කවර කලෙක ආරම්භ වී දැයි පැහැදිලි නැත (සුරවීර,1985:36-37). “ජාතිගොත්‍ර විචාරිය යුතුය” යන ව්‍යවස්ථාව ගැන ඩී.බී. ජයතිලක දැක්වූ අදහස විමසා බැලීම මෙහි දී වටනේ ය. හෙතෙම පවසන අන්දමට ධර්ම යුක්ති විරෝධ කාලානුරූප නොවන මෙම පැනවීමට අනුව ක්‍රියා කිරීම ශාසන දියුණුවට හේතු වේද යන්න යෝනිසෝ මනසිකාරයෙන් විමසා බැලිය යුතු ය. එමෙන් ම බෞද්ධ ජනයාගේ ශ්‍රද්ධාප්‍රසාදය වැඩිවීමටත්, ඔවුන් අතර වාදභේද තුනී වීමත් සැලසෙන පරිද්දෙන් මෙම ප්‍රශ්නය විසඳීම යථෝක්ත නියමය පිළිපදින සංඝයා වහන්සේලාගේ යුතුකමකි (ජයතිලක,2002:). මෙම කතිකාවතෙහි විශේෂත්වය වන්නේ බුද්ධ ශාසනයේ නොපැවති කුලභේදයකට කතිකාවත මඟින් අවසර ලැබීම ය. මෙලෙස කුලමල විෂමතා නැවත ඇති වීමට භික්ෂු සමාජයේ පරිණාමය බලපාන්නට ඇති බව ද සිතිය හැකි ය (සිරිසුමන, 2006:75). කුලසූරිය පවසන්නේ පැවිදි වීමේ දී කුලගෝත්‍ර විචාරීම නම් වූ අබෞද්ධ සිරිත පොළොන්නරු

යුගයේ කාලිංග මාඝ ආක්‍රමණයෙහි ප්‍රතිඵලයක් විය හැකි බව යි (1963:27). සමාජ ස්තරායන ප්‍රපංචයක් වන කුල භේදය බුදු දහම සපුරා ප්‍රතික්ෂේප කර තිබියදීත් කුලගෝත්‍ර විචාරමින් පැවිදි බව ලබා දෙන්නට ඇත්තේ භික්ෂූන් වහන්සේලාගේ ඥාති සංග්‍රහ හේතුවෙන් විය හැකි ය (ජයසේන සහ සිරිසුමන,2019:45). "...බොහෝ දෙනා දන්නා පරිද්දෙන් සැපත් හැර සැදැහැයෙන් පැවිදිවියටිවැ ආ කෙනෙක්වූ නම් ඇණවුම් සකස්කඩ සතර බණවර ධම්පියා පුහුණුකරවා පෙරකී ලෙසම ජාතිගොත්‍ර විචාරා රොග හලා නායකතැන් දක්වා වඳවා කතිකාබණ පුහුණු කරවා පැවිදි දිය යුතු'' (ජයතිලක,2002:12)."

මෙහි දී පැහැදිලි වන කරුණක් වන්නේ පැවිදි වීමේ දී ජාතිගෝත්‍ර විචාරිය යුතු බව කතිකාවතෙන් නැවතත් අවධාරණය කර තිබීම යි. එකල භික්ෂු පැවිද්දට අමතර ව භික්ෂූන් වහන්සේලා උදෙසා පදවි තානාන්තර පිරිනැමේ දී ද කුලගෝත්‍ර විචාරා ඇති බව දඹදෙණි කතිකාවතින් හෙළි වේ. 22 වන ව්‍යවස්ථාවට අනුව අයතැන (ආයතන) හෙවත් මූළ පදවියට පත් වීම සඳහා ගුණ නුවණින් යුක්ත වීම, විහාරයේ පැවැත්ම සඳහා වෙන් කරන ලද ඉඩම්වල ඇති අගනා ප්‍රත්‍යයෙහි නොඇලීම, ලාභගරුක නොවීම යනාදි කරුණු ප්‍රමාණවත් නො වේ. 'සංගමු ගණවැසි' යන ගමකට අයත් තෙරනමක් ද විය යුතු ය. දඹදෙණි කතිකාවතෙහි එය සඳහන් වන්නේ පහත පරිදි ය. "...ශාසනපක්ෂපාත තුන් රජයෙහි සංගමු ගණ වැසි ගම් ප්‍රසිද්ධ බැවින් ඒ ගම්හි අඛණ්ඩ සන්තතින් ආ ශික්ෂිත තෙර තනතුරුපත් කෙනකුන් නායකතෙන අදහසින් සංඝ සම්මුති රාජ සම්මුතීන් අයතැනට පැමිණිවියයුතු"(ජයතිලක,2002:16).

මේ අනුව විහාරයන්හි උසස් පදවි හිමි වී ඇත්තේ සංගමු ගණවැසි ගම්වලින් පැමිණ පැවිදි වූවන්ට පමණි. මෙලෙස ජාතිගෝත්‍ර විමසා තනතුරු ලබා දීමෙන් භික්ෂු සමාජයෙහි කුල සාධකය තවදුරටත් වර්ධනය වී ඇත. 'ගණවැසි කිලිං' යන කුලය පිළිබඳ ව දළදා සිරිතෙහි ද සඳහන් වේ (ගුණවර්ධන,(සංස්) 2008:78).

**සමාලෝචනය**

බුද්ධ දේශනාවෙහි දක්නට නොලැබෙන කුල භේදයක් දඹදෙණි යුගයේ වාසය කළ භික්ෂූන් අතර පැවති බව එවකට රචනා වූ දඹදෙණි කතිකාවතින් හෙළි වේ. මෙම කතිකාවතට අනුව පැවිදි වීමේ දී සහ ආයතිනක උසස් තනතුරු පිරිනැමීමේ දී ජාතිගෝත්‍ර විමසා ඇති බව සනාථ වේ. මෙයට පූර්වයෙන් රචනා වූ ශාසන කතිකාවත් විමසීමේ දී එවැනි කුලගෝත්‍ර විමසීමක් පොළොන්නරු කතිකාවතෙහි සඳහන් නො වේ. එහෙත් මහාවංශය වැනි ඓතිහාසික මූලාශ්‍රය විමසීමේ දී පෙනී යන කරුණක් වන්නේ අනුරාධපුර යුගයේ සිට ම භික්ෂු සමාජයෙහි කුලභේදයක් පැවති බව යි. ඔවුහු තම තමන්ගේ කුලයට අයත් විහාරාරාමවල වාසය කර ඇත. මෙය ක්‍රමික ව විකාශනය වීමෙන් දඹදෙණි කතිකාවතට ඇතුළත් වූවා යැයි සිතිය හැකි ය. අනුරාධපුර යුගයෙන් පසු බිහි වූ පොළොන්නරු රාජධානි සමය භික්ෂූන් වහන්සේලාට හිතකර කාලපරාසයක් නොවුණි. කාලිංස මාසගේ ආක්‍රමණයත් සමඟ භික්ෂු සමාජයට බොහෝ දුෂ්කරතාවන්ට මුහුණු පෑමට සිදු වුණි. දඹදෙණි යුගය පැවති කාලයට පැමිණෙන විට භික්ෂු සමාජය පිරිහීමට ලක් ව පැවතුණි. ගිහි මඟෙහි සහ පැවිදි මඟෙහි වෙනසක් දක්නට නො ලැබුණි. බුද්ධ දේශනාවන්ට අනුව පැවිද්ද සඳහා කුලගෝත්‍ර සලකා බැලීමක් සිදු නොවුණු බැවින් තත්කාලීන සමාජයෙහි පැවති කුල නියෝජනය කරමින් පැවිදි වූවන් ශාසනයට පටහැනි අන්දමින් දිවි ගෙවීමේ ප්‍රතිඵලයක් ලෙසින් "කුලගෝත්‍ර විචාරා පැවිදි කළ යුතු ය" යන සම්මතයට එවකට උසස් සංඝයා වහන්සේලා එළඹුණා විය හැකි ය. එසේ නොමැති නම් සංඝ සමාජයෙහි පවතින දූෂිතබව මඟහරවා ගැනීම සඳහා මෙවැනි පැනවීමක් සිදු කළා විය හැකි ය. දඹදෙණි යුගයේ රචනා වූ සාහිත්‍ය මූලාශ්‍රය විමසීමෙන් ප්‍රකට වන කරුණක් වන්නේ ඒවායෙහි කතුවරුන් වූ භික්ෂූන් වහන්සේලා තම කුලය පිළිබඳ වත්, තම ගුරුකුල පරම්පරාව පිළිබඳ වත් සඳහන් කර ඇති බව යි. එලෙස සිදු කරන්නට ඔවුන්ට සිදු වූයේ හීන කුල නියෝජනය කළ භික්ෂූන් වහන්සේලාට තත්කාලීන දඹදෙණි සමාජයේ පිළිගැනීමක් නොතිබූ බැවින් විය යුතු ය. භික්ෂු සමාජය වෙත

බාහිර සමාජ පිළිගැනීම ලබා ගැනීමේ අපේක්ෂාවෙන් පැවිද්දට සහ උසස් තුනතුරු පිරිනැමීමේ දී කුලගෝත්‍ර විමසුවා යැයි සිතිය හැකි ය. දඹදෙණි යුගයෙන් පසු ව මෙම කුලභේදය වර්ධනය වී ඇති ආකාරය විමසීමෙන් ද මෙය තහවුරු කර ගත හැකි ය. ඇතැම්විට භික්ෂු සමාජයෙහි ඉහළ කුලවලින් පැමිණ පැවිදි වූවන් හා හීන කුලවලින් පැමිණි භික්ෂූන් අතර පැවති අභ්‍යන්තර වියවුල් ද මෙයට බලපාන්නට ඇත. එමෙන් ම භික්ෂු සමාජයෙහි පැවති ඥාති සංග්‍රහ ද මෙයට බලපාන්නට ඇත. මෙම කරුණුවලට අනුව දඹදෙණි යුගයේ පැවති භික්ෂු සමාජයෙහි කුල භේදයක් දක්නට ලැබුණු බව දඹදෙණි කතිකාවත විමසීමෙන් නිගමනය කළ හැකි ය.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


ආරියපාල, ඇම්.බී. (2014). *මධ්‍යකාලීන ලංකා සමාජය.* බත්තරමුල්ලඃ අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

කුලසූරිය, ආනන්ද. (1963). *සිංහල සාහිත්‍යය 2.* මහරගමඃ සීමාසහිත සමන් ප්‍රකාශකයෝ.

ගුණවර්ධන, වී.ඩී.එස්. (2014). *දෙව්රඳදම්පසගිනිවන් ප්‍රණීත දළදා සිරිත.* කොළඹ 10ඃ ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

ජයතිලක. ඩී.බී. (2002). *කතිකාවත් සඟරා නම් වූ සංඝ සම්මත ව්‍යවස්ථා.* කොළඹ 10ඃ ඇස්. ගොඩගේ සහ සහෝරයෝ.

ටියුඩර් සිල්වා, කාලිංග. (2020). *කුලය, පන්තිය සහ ලංකාවේ සමාජ ගැටුම්.* බොරලැස්ගමුවඃ සී/ස. (පෞද්). විසිදුනු ප්‍රකාශකයෝ.

බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාඃ 22. (2006). අංගුත්තර නිකාය - 5. දෙහිවල ඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාඃ 25. (2006). *ඛුද්දක නිකාය - 2.* දෙහිවල ඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

බුද්ධදත්ත හිමි, පොල්වත්තේ. (2017). *පාලි-සිංහල අකාරාදිය.* කොළඹ 11ඃ සීමාසහිත ඇම්.ඩී ගුණසේන සහ සමාගම.

*මහාවංශය සිංහල* (2015). දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය

රාහුල, වල්පොළ. (1999). *ලක්දිව බුදු සමයේ ඉතිහාසය.* කොළඹ 10ඃ ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

ලියනගමගේ, අමරදාස. (1966). *ඉතිහාසයෙන් පෙනෙන භික්ෂුව හා සමාජය.* කැලණිය: විද්‍යාලංකාර වි.වි. ඉතිහාස සංගමයේ ප්‍රකාශනය.

සන්නස්ගල, පුඤ්චිබණ්ඩාර. (2013). *සිංහල සාහිත්‍ය වංශය.* කොළඹ 10: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

සිරිසුමන හිමි, අගලකඩ. (2006). *දඹදෙණි කතිකාවත සහ භික්ෂු සමාජය.* කොළඹ 08: සදීපා ප්‍රකාශන මන්දිරය.

සිරිසුමන හිමි, තිඹිරිවැව සහ නාලක ජයසේන. (2019). "භික්ෂු සමාජය හා සංඝ සංශෝධන". *දඹදෙණි යුගය: දේශපාලන හා සාහිත්‍ය සමීක්ෂා.* කොළඹ 10: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

සන්නස්ගල, පුඤ්චිබණ්ඩාර. (2013). *සිංහල සාහිත්‍ය වංශය.* කොළඹ 10: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

සිල්වා, එම්.යූ.ද. (2006). *ශ්‍රී ලංකාවේ කුල වැඩවසම් ක්‍රමය.* පුංචි බොරැල්ල: විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය.

සුරවීර, ඒ.වී. (1998). *කතිකාවත් විමර්ශන.* බත්තරමුල්ල: සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.

සුරවීර, ඒ.වී. (2002). *සිංහල කතිකාවත් සහ භික්ෂු සමාජය.* කොළඹ 11: සීමාසහිත ඇම්.ඩී ගුණසේන සහ සමාගම.

සෝරත හිමි, වැලිවිටියේ. (2013). *ශ්‍රී සුමංගල ශබ්දකෝෂය* (ප්‍රථම භාගය). කොළඹ 10: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

හෙට්ටිආරච්චි, ඩී.ඊ. (1978). *සිංහල විශ්වකෝෂය.* බත්තරමුල්ල: සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.

Rayan, Bryce. (1953). *Cast in modern Ceylon*. New bruns wick Rutges University press.